සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකය: |
|---|

**සැලකිය යුතුයි :**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

01 නබි මුහම්මද් (සල්) තුමාණන් ළඟ පළමුවෙන්ම ඉස්ලාමය වැළඳගත් කාන්තාව කවුද?
(1) ෆාතිමා (රළි) (2) අයිශා (රළි) (3) කදීජා (රළි) (4) රුකෙයා (රළි)

02 ආරක්ෂාකාරීව කටයුතු කිරීම යන අර්ථය දෙන වචනය කුමක් ද?
(1) වරඋ (2) තක්වා (3) ඉහ්ලාස් (4) ශුහ්ද්

03 නබිවරුන්ට ප්‍රදානය කරන ලද බලය යන්නෙහි අරාබි වචනය
(1) කරාමත් (2) මුඃජිසාත් (3) රිසාලත් (4) හිදායත්

04 තකීයා පද්ධතියට අයත් අකීදා කණ්ඩායම කවුරුන් ද?
(1) කවාරිජ්වරුන් (2) මුඃතසිලාවරුන් (3) මුර්ජියාවරුන් (4) ෂියාවරුන්

05 ''ඉස්ලාම විනාශවී මම ජීවත්වනවාට වඩා මම විනාශ වී ඉස්ලාමය ජීවත් වනවා මම අගය කරමි'' කියා පැවසූ ඉමාම්වරයා
(1) ඉමාම් අහ්මද් (රහ්) (2) ඉමාම් තහාවි (රහ්) (3) ඉමාම් අශ්අර් (රහ්) (4) ඉමාම් මාත්රුදී (රහ්)

06 පහත 'අ' කොටසේ කලීෆාවරුන් හා 'ආ' කොටසේ ඔවුන් ඉපදුණ කුරෙයිශි ගෝත්‍රවල් සටහන් වී ඇත.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. අබුබක්කර් (රළි) | A හාෂිම් වංශය |
| 2. උමර් (රළි) | B උමෙයා වංශය |
| 3. උස්මාන් (රළි) | C අදී වංශය |
| 4. අලි (රළි) | D බනූ කෙම් වංශය |

ඉහත සඳහන් 'අ' හා 'ආ' කොටස් දෙක යා කිරීමේ පිළිවෙල
(1) ABCD (2) BACD (3) DCBA (4) CBDA

07 ඉස්ලාමීය නීති පද්ධතියේ ''රන්වන් යුගය'' ලෙස හැඳින්වෙන යුගය
(1) උමෙයාවරුන්ගේ යුගය (2) අබ්බාසීන්ගේ යුගය
(3) කුඩා රාජ්‍ය යුගය (4) ඉහත සඳහන් කිසිවක් නොමැත

08 පහත සඳහන් මුජ්තහිද් වර්ගයට අයත් නොවන කණ්ඩායම
(1) මුජ්තහිද් මුත්ලක් (2) මුජ්තහිත් ෆිල් මද්හබ්
(3) මුජ්තහිදුල් ෆතිමා (4) මුජ්තහිද් මුජද්දිද්

09 රාජ්‍ය මට්ටමේ හදීසයන් ආරක්ෂා කිරීමට උත්සාහ දැරූ පාලකයා කවුද?
(1) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (2) කලීෆා අබ්දුල් මලික්
(3) මාමුන් (4) කලීෆා අලි (රළි)

10 ''මුෆස්සිර්'' කියන්නා
(1) හදීස් කලාවෙහි විශාරද (2) අල් කුර්ආනයේ කථිකාචාර්ය
(3) ෆික්හ් කලාවේ විශාරද (4) පල්ලියේ ඉමාම්වරයා

11 'කලීමුල්ලාහ්' යන විශේෂ නාමය ලැබූ නබිවරයා

(1) ඉබ්‍රාහීම් (අලෛ) (2) යූනුස් (අලෛ) (3) මූසා (අලෛ) (4) ඊසා (අලෛ)

12 වී වැනි ධාන්‍යවල ප්‍රථම නිසාබය කිලෝග්‍රෑම් කොපමණ ද?

(1) 689.5kg (2) 986.5kg (3) 1379kg (4) 1739kg

13 ''පොළොව සරු කිරීම'' යන අර්ථය දෙන අරාබි වචනය

(1) ඉබාදත් (2) ඉමාරත් (3) කිලාෆත් (4) කියාදත්

14 ''සව්ම්'' යන වචනයේ භාෂා තේරුම

(1) අස්වී සිටීම (2) පිරිසිදු වීම (3) ප්‍රාර්ථනය (4) කරා යෑම

15 සලාතයේ සූරතුල් ෆාතිහා පාරායනය කිරීම

(1) සුන්නත් (2) ෆර්ලු (3) මන්දූබ් (4) මුස්තහබ්

16 සලාතයේ '' තවර්රුක් ඉදුම'' ඉන්න අවස්ථාවක් කුමක් ද?

(1) ප්‍රථම සුජුදයට පසු (2) දෙවන සුජුදයට පසු

(3) ප්‍රථම අත්තහියාතයෙහි (4) දෙවන අත්තහියාතයෙහි

17 අල්කුර්ආනයේ පටන්ගැනීමේදී ''බිස්මිල්'' කියා සඳහන් නොකරපු සූරාව කුමක් ද?

(1) සූරා බකරා (2) සූරා යාසීන් (3) සූරා තව්බා (4) සූරා නිසා

18 කෙනෙක් තමාගේ භාර්යාව ශාරීරිකව තමාගේ මවට සම කිරීම කෙසේ අමතන්නේ ද?

(1) ලිආන් (2) ලිහාර් (3) තලාක් (4) ඊළාඋ

19 නබි (සල්) තුමාණන් තරුණ කාලයේ 'අස්සාදික්' කියා අමතන්නට හේතුව කුමක් ද?

(1) ඇත්ත කථා කිරීම. (2) පිළිම වන්දනා නොකිරීම.

(3) සමාජ සේවා කිරීම. (4) විශ්වාසව හැසිරීම.

20 පහත සඳහන් 'අ' කොටසේ වගකීම් හා 'ආ' කොටසේ ඒවාගේ අර්ථ දී ඇත.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. වාලි | A බදු එකතු කිරීමේ අධිකාරි |
| 2. කාතිබ් | B නීතිපති |
| 3. කාළි | C ආණ්ඩුකාරයා |

මෙහි 'අ' කොටස 'ආ' කොටසට ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) CAB (2) CBA (3) ABC (4) CBA

21 සලාතයේදී අපි ''මාලිකියව්මිද්දීන්'' යන පාරායන කරන මෙම වැකියේ අර්ථය කුමක් ද?

(1) ඔබව නමදිමු (2) ආදරවන්තයා

(3) ප්‍රතිඵල දෙන දිනයෙහි අධිපති (4) අප යහමග හිටවනු මැන

22 ''භාණ්ඩවලට ප්‍රශ්න මතුකිරීමෙන් බරකත් විනාශවේ'' යැයි නබි තුමා කීමට වඩාත් ගැලපෙන විෂයය

(1) රැවටීම (2) බොරු දිවුරම (3) පොළිය (4) මිශ්‍ර කිරීම

23 මුනාෆිකුගේ ගතිගුණ ලෙස හදීසියෙහි සඳහන් නොවූ එකක්

(1) කතා කළොත් බොරු පවසයි. (2) පොරොන්දු කඩකරයි.

(3) විශ්වාසය බිඳියි. (4) රාත්‍රියේදී සොරකම් කරයි.

24 මාස තුනක ඉද්දාව අනුගමනය කළ යුත්තන් වන්නේ,

(1) ගැබිනි මාතාවන් (2) සැමියා මැරුණ කාන්තාව

(3) තලාක් වූ කාන්තාව (4) යෞවන කාන්තාවන්

25 ඉස්ලාමීය නීති පද්ධතියේ 'සසඳා බැලීම' අමතන්නේ කෙසේද?

(1) කියාස් (2) ඉජ්මා (3) උර්ෆු (4) මස්ලහා

26 නබි (සල්) තුමාණන් යස්රිබියට ඉස්ලාමය ප්‍රචාර කිරීමට යැවූ සහාබිවරයා කවුද?

(1) මුස්අබ් (රළි) (2) උමර් (රළි) (3) සෙයිද් (රළි) (4) ජඃපර් (රළි)

27 හුදෙයිබියා ගිවිසුම සිද්ධ වූ හිජ්රි වර්ෂය කුමක් ද?

(1) 8 (2) 5 (3) 6 (4) 7

28 ප්‍රචාරය සඳහා වූ ප්‍රථම අණදීම සඳහන් සූරාව

(1) මුසම්මිල් (2) මුද්දස්සිර් (3) අලක් (4) නිසාඋ

29 නියාස් තමාගේ ව්‍යාපාරය වෙනුවෙන් තමන්සතු රුපියල් 10,000/- ණය මුදලක් වශයෙන් ලබාගනියි. මාසයකින් පසු මෙම ණය වෙනුවෙන් වැඩිපුර රුපියල් 1000/- දෙයි. ඔහු දුන් රුපියල් 11000/- හෙන් රුපියල් දාහ කෙසේ හැඳින්වේ ද?

(1) හිබා (2) සදකා (3) සකාත් (4) රිබා

30 පහත සඳහන් 'අ' කොටසෙහි කතෘවරුන් හා 'ආ' කොටසෙහි ඔවුන්ගේ ග්‍රන්ථයන් සඳහන් වී ඇත.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. ඉමාම් ගස්සාලී (රහ්) | A අර්රිසාලා |
| 2. ඉමාම් ශාෆියි (රහ්) | B ඉහ්යා උලූමුද්දීන් |
| 3. ඉමාම් මාලික් (රහ්) | C මුවත්තා |

මෙහි 'අ' කොටස හා 'ආ' කොටස යාකළහොත් ලැබෙන පිළිතුර

(1) ABC (2) BCA (3) BAC (4) CBA

31 මස්ජිද් හරාමෙහි ඉටුකරන සලාතයක් සලාත කීයකට සමාන බව නබි (සල්) තුමාණන් පවසා තිබේ ද?

(1) ලක්ෂයක් (2) දහදාහක් (3) දාහක් (4) පන්සීයක්

32 නාසිර් ගාල්ලෙ සිට යාපනය දක්වා දුම්රියක පෙ.ව. 10.00 ට ගමන් ආරම්භ කළේය. ලුහර් වේලාව වූ විට ඔහු ලුහර් සලාතය අසර් සලාතය සමග එකතුකර වැඳීමට නියියත් තැබුවේ ය. මෙලෙස ඔහු ලුහර් සලාතය අසර් සලාතය සමග එකතුකර වැන්දේය. එම සලාතය කෙසේ හැඳින්වේ ද?

(1) කස්රු (2) ජම්උ (3) ජම්උත් තක්දීම් (4) ජම්උත් තෘහීර්

33 අර්කානුල් නිකාවෙහි ඇතුළත් නොවන එකකි

(1) වලී (2) වකීල් (3) ෂාහිද් (4) ඊජාබ් කබූල්

34 අල්මාඋල් මුස්තෘමල් යනු

(1) අති ශුද්ධ වූ ජලය (2) පිරිසිදු ජලය (3) පාවිච්චි කළ ජලය (4) අපිරිසිදු ජලය

35 වුළූ ෆර්ලු වූ අවයවන්ති සංඛ්‍යාව

(1) 3 (2) 4 (3) 5 (4) 6

36 සැමියා මරණයෙන් පසු ඉද්දා අනුගමනය කරන කාන්තාවකට විවාහ යෝජනා කතාකිරීම ගැන ඉස්ලාමීය නීතිය කුමක් ද?

(1) වාජිබ් (2) හරාම් (3) මන්දූබ් (4) මක්රූහ්

37 නබි (සල්) තුමාණන්ගේ යුගයේ මරණ ලද බොරුකාර නබිගේ නම කුමක් ද?

(1) මුසෙයිලමා (2) දුලෙයිහා (3) සජා (4) අශ්වද් අන්සි

38 නබි (සල්) තුමාණන් විසින් යමන් ප්‍රදේශයට ආණ්ඩුකාරයෙකු ලෙස යවන ලද සහාබි කවුද?

(1) මුආද් බින් ජබල් (රළි) (2) සෑද් බින් අබි වක්කාස් (රළි)

(3) සෙයිද් බින් සාබිත් (රළි) (4) උස්මාන් බින් අෆ්වාන් (රළි)

39 හජ්, උම්රා දෙකටම පොදුවෙන් යෙදෙන ක්‍රියාවක් නොවන්නේ,

(1) ඉහ්රාම් (2) තවාෆ් (3) ජම්රා (4) සෑයු

40 ලක්ෂ දහයක් වටිනා ව්‍යාපාර භාණ්ඩ වසරක් පුරා හබාගෙන සිටින ව්‍යාපාරිකයෙක් තමන්ගේ භාණ්ඩවලට සකාත් දියයුතු ගණන (ප්‍රමාණය) කොපමණද කියා රුපියල්වලින් මනින්න. (පවුමක වටිනාකම රු. 50,000/- වේ.)

(1) රු. 10,000/- (2) රු. 2.500/- (3) රු. 25,000/- (4) රු. 50,000/-

(1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය **ඉස්ලාම් ධර්මය - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.
- (i) ජලයේ වර්ග දෙකක් ලියන්න.
- (ii) ඉස්ලාමයේ කියාතිබෙන ශුද්ධස්ථාන දෙකක් සඳහන් කරන්න.
- (iii) සහීහෙයින් කියා අමතනු ලබන හදීස් ග්‍රන්ථ කුමක් ද?
- (iv) අර්කානුල් කියාස් දෙකක් සඳහන් කරන්න.
- (v) මුජ් තහිද්වරුන් දෙදෙනෙකුගේ නම් සඳහන් කරන්න.
- (vi) නෝම්බි ඇල්ලීමට තහනම් වූ දින දෙකක් ලියන්න.
- (vii) සකාද් ගැන කියවෙන කුර්ආන් වැකියක් ලියන්න.
- (viii) තයම්මුම් කිරීමට ඇති අවයවන් දෙක ලියන්න.
- (ix) විවාහය මගින් මහ්රම් වන දෙන්නෙක් සඳහන් කරන්න.
- (x) ඉස්ලාමයේ ප්‍රධාන නීති මූලයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු $2 \times 10 = 20$)

(02)
- (i) ආධ්‍යාත්මික උන්නතිය පිළිබඳ වූ කුර්ආන් වැකියක් ලියන්න.
- (ii) ආධ්‍යාත්මික ගුණාංග තුනක් ලියන්න.
- (iii) සුන්නා, කුර්ආනයට විසඳුමකි. මෙහි උදාහරණ පෙන්වා කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

(03)
- (i) අරාබිවරුන් ලංකාවට පැමිණීමට වාසිවූ හේතුන් දෙකක් ලියන්න.
- (ii) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් මුල් කාලයේ පදිංචි වූ නගර තුනක් ලියන්න.
- (iii) ලාංකික මුස්ලිම්වරුන් රටේ ආර්ථික සංවර්ධනයට කළ දායකත්වය (සහයෝගය) පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු $2 + 3 + 5 = 10$)

(04)
- (i) සලාතයේ වැදගත්කම පිළිබඳව කුර්ආන් වැකියක් උදාහරණයක් ලෙස පෙන්වන්න.
- (ii) සලාතයේ ෂර්තයන් (කොන්දේසි) තුනක් ලියන්න.
- (iii) සලාතයෙන් ලැබෙන ප්‍රයෝජන පහක් විස්තර කරන්න. (ලකුණු $2 + 3 + 5 = 10$)

(05)
- (i) ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ මූලිකාංග දෙකක් සඳහන් කරන්න.
- (ii) ඉස්ලාමීය ආර්ථිකයේ විශේෂාංග 3 ක් සඳහන් කරන්න.
- (iii) ආර්ථිකමය ක්‍රියාවන් දේව නැමදුමක් (ඉබාදත්) වශයෙන් ඇතිකිරීමට පිළිපැදිය යුතු කරුණු මොනවාද?

(ලකුණු $2 + 3 + 5 = 10$)

(06)
- (i) අකීදා යනු කුමක් ද?
- (ii) අකීදාවෙහි චාම් භාවය අභිමිවීමට හේතුන් හයක් දක්වන්න.
- (iii) අහ්ලුස්සුන්නා වල්ජමාඅත් අකීදාවෙහි පහත සඳහන් කරුණු පිළිබඳ වූ අදහස් කෙටියෙන් විස්තර කරන්න.
  අල්ලාහ් / මලාඉකාවරුන් / අල්කුර්ආනය / රිසාලත් / කියාමත් දිනය (ලකුණු $2 + 3 + 5 = 10$)

(07) පහත සඳහන් ඒවායින් දෙකකට කෙටි සටහන් ලියන්න.
- (i) ඉද්දා හා එහි ප්‍රයෝජන
- (ii) තාරුණ්‍යයේ වැදගත්කම
- (iii) නබි (සල්) තුමාගේ මක්කා ජීවිතය
- (iv) කලීෆා උස්මාන් (රළි) තුමාගේ සේවය

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(2) | 4 -(4) | 5 -(1) | 6 -(3) | 7 -(2) | 8 -(4) | 9 -(1) | 10 -(2) |
| 11-(3) | 12 -(3) | 13 -(2) | 14 -(1) | 15 -(2) | 16 -(4) | 17 -(3) | 18 -(2) | 19 -(1) | 20 -(4) |
| 21-(3) | 22 -(2) | 23 -(4) | 24 -(3) | 25 -(1) | 26 -(1) | 27 -(3) | 28 -(2) | 29 -(4) | 30 -(3) |
| 31-(1) | 32 -(4) | 33 -(2) | 34 -(3) | 35 -(2) | 36 -(2) | 37 -(4) | 38 -(1) | 39 -(3) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) අති ශුද්ධවූ ජලය / පිරිසිදු ජලය / අපිරිසිදු ජලය
(මාඋත් තහුර් / මාඋත් තාහිර් / මාඋල් මුතනජ්ජිස්)

(ii) මස්ජිදුල් හරාම්, මස්ජිදුන් නබවි, මජ්ජිදුල් අක්සා

(iii) බුහාරි, මුස්ලිම්

(iv) අස්ල්, ෆර්උ, ඉල්ලත්, හුකුම්

(v) ඉමාම් මාලික් (අත්) / ඉමාම් ශාෆි (රහ්) / ඉමාම් අහ්මද් (රහ්) / ඉමාම් අබූ හනීෆා යනාදීන්

(vi) ඊද් (උත්සව) දවස් දෙක - අය්යාමුත් තෂ්රීක් තෙදින / සැක සහිත දින

(vii) තවද ඔවුහු සකාතය ඉටු කරන්නෝ ය. (23.4)

(viii) මුහුණ හා අත්දෙක

(ix) භාර්යාවගේ මව / භාර්යාවගේ දුව / පුතාගේ භාර්යාව / පියාගේ භාර්යාව

(x) අල්කුර්ආනය හා සුන්නා

02 (i) නුඹගේ 'රබ්' මලක්වරුන් හමුවෙහි නියතව මම මිනිසාව මැටියෙන් මවන්නට යමියි පැවසූ දෙය ගැන (නබිඃ නුඹ සිතා බලන්න. 38, 71, 72)
එය පවිත්‍ර කරගත් කෙනා නියතව ජය ලැබුවේ ය. එය අපවිත්‍ර කළ කෙනා නියතව පාඩුව ලැබුවේ ය. (91, 9, 10)

(ii) සබ්ර් / තවක්කුල් / මඃරිෆා / රිළා

(iii) සලාතය කරන්න... නැමති කුර්ආන් වැකිය සලාත්ය නමදින ආකාරය සඳහන් කර නැත. මෙය සුන්නා මගින් අපට ඉතා පැහැදිලිව ක්‍රියාවෙන් පෙන්නුම් කර දී තිබේ. (මෙවැනි උදාහරණ)

03 (i) ශ්‍රී ලංකාවේ පිහිටීම / ලංකාවේ ස්වාභාවික සෞන්දර්යය / මුහුදු මාර්ග පහසුකම් / අවශ්‍ය වූ වෙළඳ ද්‍රව්‍ය / අයහපත් කාලගුණය වැනි

(ii) කොළඹ / බේරුවල / ගාල්ල / මාතර / පුත්තලම ආදී ......

(iii) ලංකා අපනයන ද්‍රව්‍ය පිටරටවල්වලට අපනයනය කිරීම / වගා කිරීමේ යෙදීම / තවලම් ගමන හඳුන්වා දීම / රෙදි විවීම පිළිබඳ හඳුන්වාදීම.

04 (i) 'සලාතය ස්ථාවර කරන්න.'
''නියත වශයෙන්ම සලාතය වේලාව සඳහන් කළ යුතුකමකි.'' මෙවැනි වැකි

(ii) * මුස්ලිම් කෙනෙකු වීම.
* 'තම්යිස්' නම් හොඳ නොහොඳ දැන ගැනීම.
* ශරීරය, වස්ත්‍රය හා සලාත් ඉටුකරන ස්ථානය නජිස් නොමැතිව පිරිසිදුව තිබීම / අව්රතය ආවරණය කර ගැනීම / කිබ්ලාව පෙරටුකර ගැනීම

(iii) ස්වර්ගය ලැබීම / දේව භක්තිය ලැබීම / දේව දායාදය ලැබීම

05 (i) ප්‍රතිපත්තිමය මූලිකාංග / විශ්වාසනීය මූලිකාංග
ක්‍රියාවට නැංවීමේ මූලිකාංග

(ii) දේව භාවය, සමාජ ආර්ථික වෙනස්කම් සමකිරීම, සමාජ හා ඒක පුද්ගල යහපත උදෙසා තිබීම, කිසිවෙකුටත් අසාධාරණ නොවීම.

(iii) පිරිසිදු චේතනාව මූලික නැමදුම්වලට බාධා නොවීම. / ශරිආ නීතිරීති උල්ලංඝනය නොකිරීම / නිවැරදිව හා පිළිවෙළට කිරීම

06 (i) අර්කානුල් ඊමාන් යන මූලික ඉස්ලාමීය විශ්වාසයන් හා ඒවා පිළිබඳ සියල්ල ස්ථිරවම පිළිගෙන විශ්වාස කිරීම.

(ii) මුස්ලිම් සමාජය තුළ මතුවූ දේශපාලන ප්‍රශ්න, සෙසු අයගේ චේතනාවන්, ආගම් සමග ඇතිවූ සම්බන්ධතාවය හා අන්‍යෝන්‍යතාවය, ආශාවන්වලට වහල්වීම, බුද්ධිය සීමාවකින් තොරව භාවිතා කිරීම, මෝඩ විශ්වාසයන්

(iii) අල්ලාහ් සෑම වස්තුවක්ම නිපයූ තැනැත්තා ඔහු සදාකාලිකව ජීවය ඇත්තා ය. මලක්වරුන් අල්ලාහ් තආලාගේ මැවුම්හි ශ්‍රේෂ්ඨයෝ ය. අල්ලාහ් තආලාගේ අණ පරිදි ක්‍රියා කරන්නෝය. අල්කුර්ආනය මිනිසුන්ට යහමග පෙන්වීමට පහළ කරන ලදී. තවද මිනිසුන්ට යහමග පෙන්වීමට රිසාලත් ප්‍රදානය කරන ලදී. කියාමත් දවස විනිශ්චය කරන දවස තිබෙන බව..... මෙලෙස සඳහන් කර ඇත්නම්

07 (i) ඉද්දා යනු කුමක් ද, එහි වර්ග, නීතිරීති, ප්‍රයෝජන වැනි දේවල් ලියා ඇතොත් ලකුණු 5 කි.

(ii) තාරුණ්‍යයේ වැදගත්කම ගැන පෙන්වා, එය යහමග ගෙවීමට පිළිපැදිය යුතු දේවල් පිළිබඳව ඉස්ලාම් කියන ආකාරයට ලියා ඇතොත් ලකුණු 5 යි.

(iii) නබි (සල්) තුමානන් මක්කාවෙහි ඉපදී හැදී වැඩීම / එතුමාගේ හතළිස් වැනි වියෙහිදී රමළාන් මාසයේ දූත භාවය ලැබීම / ඉස්ලාම් ප්‍රචාරයේ යෙදීම / විරුද්ධවාදීන්ගේ විරුද්ධතාවය / හිජ්රත් යෑම ආදී වශයෙන් විස්තර කර ඇතොත් ලකුණු 5 යි.